ධම්මං පීති සුඛං සේති - විප්පසන්නේන චේතසා
(දහම් රස බොන්නෝ සුවසේ නිදි වෙසෙන්නෝ)



# බෞද්ධ සංගමය

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
අංක : 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල
දුරකථන : 011 2864134

ප්‍රධාන අනුශාසක :
බත්තරමුල්ල සිරි සුදස්සනාරාමාධිපති පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි

සදහම් පත්‍රිකා අංක 05

**බු.ව 2553 පොසොන් පොහොය**

**උතුම් චතුරාර්ය සත්‍ය අවබෝධ වීමට සඳහම් පඬුරකි**

# නොහඬන්න, සැනසෙන්නට මඟක් සොයමු

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

"අනුමතග්ගෝයං භික්ඛවේ සංසාරෝ, පුබ්බාකෝටි නපඤ්ඤායති
අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං
සන්ධාවතං සංසරතං දීඝරත්තං වෝ භික්ඛවේ දුක්ඛං පච්චනුභූතං"

"මහණෙනි මේ සසර බොහෝ දීර්ඝය, එබැවින් අවිද්‍යාවෙන් වැසී තණ්හාවෙන් බැඳී සසරෙහි ගමන් කරන සත්වයන්ගේ පූර්ණ සීමාවක් හෝ මුලාරම්භයක් නොපෙනේ"

ඔබ සැමට කරුණාවෙනි,

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහනසේ විසින් දේශිත සංයුත්ත නිකායේ අනුමතග්ග සංයුත්තයේ සඳහන් අස්සු සූත්‍රයේ ප්‍රථම සදහම් සිතිවිල පෙළයි ඉහත සඳහන් කරුනු ලැබුවේ මෙම සූත්‍ර දේශනාව විස්තර කරන්නට පළමුව එම සූත්‍ර දේශනාවේ සාරාංශය මෙහි ඇතුළත් කරමි. ධර්මය නුවණින් දැකීමේ අධිෂ්ඨානයක් ඇතිකරගෙන මෙම සදහම් පෙළ කියවා නැවත නැවතත් මෙනෙහි කරන්න. තථාගත බුදුරජාණන් වහන්සේ ස්වාමීන්වහන්සේලාගෙන් මෙසේ ප්‍රශ්න කරති. "මහණෙනි, නුඹලා විසින් බොහෝ කාලයක් දුක් විඳින ලදී. ඒ කුමක් නිසාදැයි සිතන්නේ ද ? මේ දීර්ඝව පවතින සසරෙහි සැරිසරන විට අමනාපයන් හා එක්වීමෙන් හා මනාපයන්ගෙන් වෙන්වනවිට නොවේද ? එවිට නුඹලා හඬන වැළපෙන විට වැගුරූ කඳුළු සිවු මහා සාගරයෙහි ජලයට වඩා වැඩිවේ ද ?" ස්වාමීන් වහන්සේලා මෙසේ පිළිතුරු දෙති.

"භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය අවබෝධ කරගතිමු. දිගු කලක් මුළුල්ලේ පවතින සසරෙහි අවිද්‍යාවෙන් වැසී තෘෂ්ණාවෙන් බැඳී, අමනාපයන් හා එක්වීමෙන්ද මනාපයන්ගෙන් වෙන්වීමෙන් ද හඬමින් හා වැළපෙමින් වැගුරූ කඳුළු සිවුමහා සාගරයෙහි ජලයට වඩා වැඩිය"

තථාගත බුදුරාජාණන් වහන්සේ තවදුරටත් පැහැදිලි කරමින් දේශනා කරති. "මහණෙනි, නුඹලා දීර්ඝ කාලයක් මවුවරුන් මිය යාම නිසා දුක් වින්දහ. එසේ මනාපයන්ගෙන් වෙන්වීම නම් වූ මව වෙන්වීම නිසා හඬන වැළපෙන විට වැගුරූ කඳුළු සිවුමහා සාගරයෙහි ජලයට වඩා වැඩිය. මහණෙනි, නුඹලා විසින් බොහෝ කාලයක් පියවරුන් මිය යාම නිසා, දුක් විඳින ලදී. සොහොයුරා මියයාම නිසා ද සොහොයුරිය මිය යාම නිසාද, පුතා මිය යාම නිසාද, දුව මියයාම නිසාද, බොහෝ දුක් වින්දාහ. එමෙන්ම ඥාතීන්ගේ වියෝවීමේදී ද භෝග විනාශයේ දී ද රෝග ව්‍යසනවලදී ද බොහෝ දුක් වින්දාහ. එහිදී නුඹලාගෙන් වැගුරුනු කඳුලු ඉතාම වැඩිය. සමාන කිරීමේදී සිවුමහා සාගරයෙහි ජල මඳය. ඒ කවර හේතුවක් නිසාද ? මේ සසර අග මුල නොපෙනෙන නිසාය. මහණෙනි, එහෙයින් සියලු සංස්කාර යන්හි කළකිරෙන්නට නිසිමය. නොඇලෙන්නට නිසිමය. සසරින් මිදෙන්නට නිසිමය"

මෙම උතුම් සූත්‍ර දේශනාව ශ්‍රවනය කරන විට සසරෙහි ඇති බියකරු බව හා දුකින් පිරුනු බව මැනවින් පැහැදිලි වෙයි. මෙහි දී මතුකොට පෙන්වා දේශනා කරනු ලැබුවේ පන ඇති හෝ පන නැති ප්‍රිය වස්තුන්ගෙන් වෙන්වීමේදී විඳි හා විඳින දුක පිළිබඳවය. ඔබ හා අප සෑම අයෙකුටම මෙම විපරිණාම දුක්ඛය පිළිබඳ හැබෑ අත්දැකීම් ඇත. අපගේ මතකයේ රඳා පවතින්නේ මේ ජීවිතයේ ලද ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක්ඛයන්ය. තථාගත බුදුරජාණන් වහනසේ විසින් අවබෝධ කරගත් චූතුපපාත හා පුබ්බේනිවාසානුස්සති ඥානයන්ගෙන් සසර ගමනේ පවත්නා යථා ස්වභාවය කරුණාවෙන් දේශනා කරන ලදී. තමන් වහන්සේගේ මෙන්ම සියළු සත්වයන්ගේ චුති හා උපත් පිළිබඳව බුදුරජාණෝ නුවණින් දුටුහ. මව, පියා, සොහොයුරා, සොහොයුරිය, පුතා හා දුව ආදී ප්‍රියයන්ගෙන් වෙන්වන විට හා ප්‍රිය වස්තුන්ගෙන් ඈත්වන විට හඬා වැළපී වැගුරූ කඳුළු සිවුමහා සාගරයේ ජල කඳටත් වඩා වැඩිවන බව වදාළේ එම නුවණිනි. දීර්ඝ සසර ගමනම ඔබට මෙනෙහි කරන්නට අපහසු වූවත් මේ ජීවිතයේ ඉහත සඳහන් කළ කුමක් හෝ කවරෙකුගේ හෝ වෙන්වීමෙන් විඳි දුකක් පිළිබඳව මෙනෙහි කරන්නට පුළුවනිද ? තථාගත බුදුරජාණන් වහන්සේ දවස ස්වාමියා දරුවන්, දෙමාපියන්, සොහොයුරා මිය යාමෙන් ශෝකයට පත්ව සිහි විකල් වී ඇවිද ගිය පටාචාරාවන්ගේ දුකින් පිරුණු හදවත හා කඳුළින් පිරුණු දෙනෙත් ඔබට තේරුම් ගන්නට පුළුවනි ද ?

මළ පුතුගේ සිරුරු උරමත හොවාගෙන හඬමින් බෙහෙත් සොයා ඇවිද ගිය සොවිං පිරුණු කිසා ගෝතමියගේ සිත ඔබට තේරුම් ගන්නට පුළුවනි ද ? මිනිබිරියක් මිය යාම නිසා මහ දහවල තෙමෙවල කඩාගෙන තෙතබරිතව සොවින් යුතුව බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි විශාකාවන්ගේ කතාව සිහිගන්වන්නට හැකි ද ? මුනුපුරා වූ පුංචි රාහුල පැවිදි වූ විට වේදනාවට පත්ව පැමිණ "දෙමාපියන්ගෙන් අවසර නැතිව දරුවන් පැවිදි කරන්නට එපා" යයි සුදෝවුන් රජුන් බුදු රදුන් හමුවෙහි පැවසූ අයුරු ද ඔබට සිහපත් කළ හැකිය. සත් වසර පුරාම තම පුතා දැකගන්නට බැරිව සොවින් පෙළී දුක් විඳි කුමාර කාශ්‍යප මෙහෙණිය පිළිබඳව ද මෙහිදී සිහිපත් කරමු.

භෝග ව්‍යසනයේදී දුක් වී ශෝකයෙන් හඬමින් සිටි පිරිස් කොපමණ නම් වෙත් ද ? ලෙඩදුක් ඉදිරියේ දුකට පත් හඬමින් සිටින පිරිස් කොපමණ නම් වෙත් ද ? යම් විටෙක සුව කිරීමට අපහසු රෝගාබාධයන්ට පත්වී පමණක් නොව අපමණ ශාරීරික වේදනා විඳින දහස් ගනනාවක් අප අතරම ජීවත් නොවේදැයි සිතා බලන්න. රෝහලකට පිය නැගූ ඔබ සහ මා මේ පිළිබඳ කොයිතරම් නම් අත්දැකීම් ලබා ඇත් ද ? "අනේ මෙහෙම නම් දුක් විඳිමින් මොකට ජීවත් වන්නේ ද ? " යයි පවසමින් "මට නම මෙහෙම ජීවත් වෙලා වැඩක් නැහැ, මෙයට වඩා හොඳයි මිය දෙන එක යයි පවසන සිතුවිලි පිළිබඳව ඔබටත් අත්දැකීම් තිබේ ද ? නිරෝගීව සිටින අවධියේදී හා තරුණ අවධියේදී දොරගුළු වසාගෙන නමුත් ඇඳුමක් මාරුකර ගැනීමට ලජ්ජා පැවිතියත් ලෙඩදුක් ඉදිරියේ අසරණ වූ විට කුමන නම් ලැජ්ජාවක් ද ? වෙනදා අන් තැනක අපිරිසිදු යමක් දුටුවිට පිළිකුලෙන් නාසය වසා ගත්තත් ව්‍යාධීන් ඉදිරියේ තමාම මළ මුත්‍රා මත වැතිරී අසරණ වැටී සිටින විට ඇස් දෙකෙන් පමණක් නොව හදවතින්ද හඬන හැඩුන් වගුරන කඳුළු කොපමණ නම් වෙත් ද ?

තථාගත බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ අස්සු සූත්‍රයේ ගැබ් වී ඇති උතුම් දහම් කරුණු ඔබගේම ජීවිතය, පවුල් පරිසරය හා අවට වටාපිටාව හා සමඟින් ගළපා බලා නුවණින් අවබෝධ කරගන්නට උත්සාහ ගන්න.

මීලඟට තථාගත බුදුරජාණන් වහනසේ විසින් සූත්‍රය අවසානයේ කරන ලද අවවාදයක් බඳු වූ ධර්ම පාඨයන් කෙරේ සිත් යොමු කිරිම අගනේය. එනම් "මහණෙනි එයින් සියළු සංස්කාරයන්හි කළකිරෙන්නට නිසිමය. නොඇලෙන්නට නිසිමය. මිදෙන්නට නිසිමය'' කුමක් ද මේ සංස්කාර ධර්මයෝ නම් ? භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැහැදිලි කරති.

"තීණිමානි භික්ඛවේ සංඛතස්ස සංඛත ලක්ඛණානි, කතමත්තීණි ? උප්පාදෝ පඤ්ඤායති, වයෝ පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤතත්ථං පඤ්ඤායති" සංස්කාරා වස්තූන්හි ලක්‍ෂණ තුනක් දක්නට ලැබේ. හට ගැනීම, විනාශය හා සිටියහු වෙනස්වීමයි. එසේනම් සවිඤ්ඤාණක හෝ අවිඤ්ඤාණක සෑම වස්තුවකගේ යථා ස්වභාවය නම් ඇති වී බිඳී විනාශ වී යාමයි. මව, පියා සොහොයුරා, සොහොයුරිය, පුතා, දුව, ස්වාමියා, බිරිඳ හෝ කවර නම් ප්‍රිය කෙනෙක් වුවද මෙම සංස්කාර නම් වූ වචනයට අයත් ය. අවිඤ්ඤාණක වස්තූන් වූ ගේදොර ධන ධාන්‍ය ආදී සියළු වස්තූන් ද මෙම සංස්කාර නම් වූ වචනයට අයත් ය. අවිද්‍යාව නම් මෙම සංස්කාර වස්තූන්හි ඇති හටගෙන, බිඳී විනාශයට යාම නම් ධර්මතාවය නොදැනීමයි. අවබෝධ නොකර ගැනෙන හා නුවණින් ද සමාධියෙන් ද නොදැකීමයි. මෙම අවබෝධයෙන් නොදැකීම නම් වූ අවිද්‍යාව නිසා රූප ආදී අරමුණු ඇස ආදී ඉන්ද්‍රියන්ගෙන් " මගේ, මගේ, මමය, මමය, මගේ ආත්මයයි, ජීවිතයයි" කියමින්

"ඇලෙයි, බැඳෙයි, එම වස්තූන් හෙවත් අරමුණුවල වෙනස්වීමේ දී හා අමනාපයේදී ගැටෙයි. එනම් ද්වේශයට පත් වෙයි. වෛරයට හා ක්‍රෝධයට පත් වෙයි. එකක් ගිලිහී යනවිට තව වස්තුවක් හා ඉන්ද්‍රියන්ගෙන් ඇලෙයි බැඳෙයි. නැවතත් ලෝභය හා ද්වේෂය හටගනී. ඇතිවී, බිඳී, විනාශයට පත්වන ස්වභාවය සෑම වස්තුවක උරුමයෙන් ගැබ්ව පැවතීම නුවණින් නොදක්නා වූ මෝහය විසින් සත්වයා සසරෙහි දුක්දෙමින්, හඬවමින්, රිදවමින් රැගෙන යයි. තෘෂ්ණාවෙන් බැඳී ඇතැයි පවසන ලද්දේද මෙම ස්වභාවයයි. මේ අයුරින් තෘෂ්ණාව නිසා අනන්ත සසරෙහි සිවුමහ සයුරන්ටත් වඩා හැඩුවා නම්, එය නතර කරන්නට බුදු සමිඳුන් දෙසූ දහමට ප්‍රතිපත්තියෙන්ම සමීප වෙමු. ඔබ සැමට උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ වේවා , නිර්වාණාවබෝධයම වේවා.

**බත්තරමුල්ල පන්නිපිටිය පාරේ සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක ආචාර්ය පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ විසිනි.**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ යෙදී සිට මියගිය සියළු දෙනාම සුගතියෙන් සුගතියට පත්වීමට මේ පින හේතුවේවා ! එතෙර රැකියාවෙහි නිරතවන සියළුම සංක්‍රමණික සේවකයින්ට ද දැනට සේවයේ යෙදී සිටින සභාපතිතුමා ඇතුළු සියළු කාර්ය මණ්ඩලයටද නිරෝගී සුව දීර්ඝායුෂ පැතීම සඳහා බෞද්ධ සංගමය දහම් පඬුරකි**

**ඔබේ මියගිය ඥාතීන් සිහිපත් කර මෙම සදහම් පත්‍රිකාව මුද්‍රණය කිරීමට ඔබට දායක විය හැක.**
**දුරකථන : 011 2864134**